**කල්පිටිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 26 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව විසින් ඉඩම් හා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීම වෙනුවට ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ වියදම පමණක් ගිණුම්ගත කර තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලිවල තක්සේරු වාර්තා ලබාගන්නා ලෙස විෂයභාර නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.105,300 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | අතපසු වීමකින් සිදුවී ඇති අතර එය 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී කල්පිටිය බස් නැවතුම්පලෙහි හා කල්පිටිය සති පොලෙහි සවිකරන ලද නාම පුවරු දෙකෙහි වටිනාකම වූ රු.131,100 ක්, රු.63,300 ක ඉනිමගක් හා රු.19,600 ක් වටිනා UPS 05 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ නිවැරදි කර ගිණුම්ගත කරන බව දන්වමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් හතරක උපලේඛන/ උපයෝගී පොත් අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර නොසැසඳීම්වල එකතුව රු.255,123 ක් විය. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛනවල ඇති ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | තැන්පත් ලේඛනයේ වසර කිහිපයක සිට පවතින රු.232,478 ක වෙනස හා අක්කර බදු හා මස් කඩ කුලී ලේඛනවල වෙනස නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(i) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 09 ක ශේෂවල එකතුව රු.75,695,913 ක් වූ අතර එයින් වර්ෂ 05 ක කාලයක් ඉක්මවූ ශේෂ එකතුව රු.10,694,549 ක් විය. | අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කඩිනම් පියවර ගනු ලබන අතර අත්තිකාරම් කඩිනමින් පියවීමට කටයුතු කරන බවත් දන්වමි. |

**(ii) ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 08 ක එකතුව රු.28,448,075 ක් වූ අතර එයින් වර්ෂ 05ක කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.7,517,990 ක් විය. | ගෙවිය යුතු වියදම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු වියදම් ගෙවීමටත්, කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමටත් කටයුතු කරන බව දන්වමි. |

**(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතු වටිනාකම රු.259,705,106 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ | අදාල ලේඛන හා උපලේඛන යාවත්කාලීන නොවීම නිසා විගණනයට ඉදිරිපත් නොකරන ලදී. ඉදිරියේදී ඒවා ඉදිරිපත් |

| | | | |
|---|---|---|---|
| | | යුතු වේ. | කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | **(i)**136 වගන්තිය | සභා සීමාව තුල පිහිටි සභාවට අයත් බදු දෙන ලද හෝ කුලියට දෙන ලද දේපළ සම්බන්ධයෙන් වූ වරිපනම් සහ අක්කර බදු ආදායම් බිල්කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරුව සිදුකර ඇති අතර වරිපනම් මුදල් අදාල බදුකරුවන්ගෙන් අයකරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. |
| | **(ii)** 158 වගන්තිය | වරිපනම් හා අක්කර බදු හිඟ මුදල් අයකර ගැනීම සඳහා එම බදු ගෙවිය යුතු අයගේ චංචල හා නිශ්චල දේපළ තහනමට ගෙන හිඟ මුදල් අයකර තැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වන විට රු.10,000ට වැඩි වරිපනම් පැහැර හරින්නන්ගේ චංචල දේපළ තහනම් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | |
| | **(i)** අංක 5(7) රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | දැනටමත් විගණන කටයුතු සිදු කරන අතර මූල්‍ය හා ගබඩා කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට උපදෙස් ලබාදී ඇත. |
| | **(ii)** අංක 59 රීතිය | සභා බල ප්‍රදේශය තුල වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් පිළිබඳ | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 සමීක්ෂණ පවත්වා අදාළ රීති ප්‍රකාරව ලැයිස්තු ඉදිරිපත් කරන |

| | | | |
|---|---|---|---|
| | සමීක්ෂණයක් පවත්වා ලයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | | ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. |
| **(iii)** අංක 65 රීතිය | ගෙවීම පැහැර හරින තැනැත්තන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. |
| **(iv)** අංක 218 රීතිය | සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කරවීමට පරීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී නිවැරදිව වත්කම් ලේඛන ඉදිරිපත් කිරීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,068,615 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,987,905 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| වරිපනම් බදු | 2,225 | 3,204 | 1,739 | 10,521 | 1,664 | 2,363 | 7,099 | 10,049 |
| කුලී | 10,968 | 10,056 | 8,643 | 7,179 | 12,139 | 9,721 | 8,349 | 6,885 |
| බලපත්‍ර ගාස්තු | 4,136 | 2,607 | 2,607 | 60 | 3,800 | 2,665 | 2,665 | 63 |
| වෙනත් ආදායම් | 96,116 | 91,566 | 48,143 | 43,424 | 83,626 | 67,771 | 12,760 | 27,504 |
| | ---------- | --------- | -------- | ---------- | --------- | -------- | -------- | ---------- |
| එකතුව | 113,445 | 107,433 | 61,132 | 61,184 | 101,229 | 82,520 | 30,873 | 44,501 |
| | ====== | ===== | ===== | ====== | ====== | ===== | ===== | ====== |

රැස් කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සමස්ත ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කළද වරිපනම් බදු, අක්කර බදු හා ජල බදු ආදායම් රැස්කිරීමේ දුර්වලතාවයන් පැවතුණි. | අයවිය යුතු ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කල යුතු වේ. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමටත්, සමීක්ෂණය අනුව අක්කර බදු අයකර ගැනීමටත්, ජල නල නවීකරණයෙන් පසු ජල බදු අයකර ගැනීමටත්, නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

### 2.2.3 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.9,122,757 ක් වූ අතර එම හිඟයෙන් වර්ෂ 01 ට වැඩි වර්ෂ | අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | 1990 න් පසු නැවත වරිපනම් සංශෝධනය 2010 සිදුකර ඇති අතර වරිපනම් වටිනාකම ඉහළ ගොස් ඇති බැවින් ගෙවීම ගැටළු සහගත වී ඇත. මෙම වටිනාකම් කොටස් වශයෙන් |

| | | |
|---|---|---|
| 05 ට අඩු රු.2,642,839 ක්ද වර්ෂ 05 ට වැඩි රු.5,180,223 ක්ද විය. | | අයකර ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. |

**2.2.4 අක්කර බදු**

-----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.829,162 ක අක්කර බදු හිඟයක් වූ අතර එම හිඟයෙන් රු.506,555 ක් අවුරුදු 05කට වැඩි කාලයක සිට හා රු.297,565 ක් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක සිට අයවීමට තිබූ ඒවා විය. | අයකරගත යුතු ආදායම් අයකර ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට මෙම අක්කර බදු සමීක්ෂණය සඳහා කණ්ඩායමක් පත් කර ඇත. ඒ අනුව හිඟ මුදල් අයකර ගැනීමට උපදෙස් දී ඇත. |

**2.2.5 කුලී**

------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී හා බදු කුලීවල එකතුව රු.7,178,620 ක් වූ අතර එම හිඟයෙන් රු.4,712,873 ක් අවුරුදු 05 කට වැඩි කාලයක සිට හා රු.787,243 ක් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක සිට අයවීමට තිබූ ඒවා විය. | අයවිය යුතු ආදායම් කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | කඩ කාමර කුලී තක්සේරු කටයුතු සිදු කර ඇත. ඒ අනුව නව ගිවිසුම්වලට එළඹී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. |

**2.2.6 බලපත්‍ර ගාස්තු**

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1980 සිට 2010 වර්ෂය දක්වා ව්‍යාපාරික ස්ථාන 83 කින් රු.60,415 ක හිඟ වෙළඳ බලපත්‍ර ශේෂයක් පැවතුණි. | අයවිය යුතු ආදායම් කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම මුදලින් රු.9,500 ක් අයකර ඇති අතර හිඟ ගාස්තු ධීවර සංක්‍රමණිකයින් නිසා ඔවුන්ගෙන් අයකර ගත නොහැකි බැවින් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත කපා හැරීමට ඉල්ලුම් කර ඇත. |

**2.2.7** **වෙනත් ආදායම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ කුලී ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන ලියාපදිංචි කර ගාස්තු අයකිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානවලින් ගාස්තු අයකිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. | දැනට ත්‍රීරෝද රථ සංගම් 12 ක් ලියාපදිංචි කර ඇති අතර ඉදිරියේදී ඉතිරි සංගම් ලියාපදිංචි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ප්‍රාදේශීය සභාවේ ජල ව්‍යාපෘතිය මගින් නිවාස හා ව්‍යාපාරික ස්ථාන 200 කට ආසන්න ප්‍රමාණයකට ජල සම්බන්ධතා ලබාදී තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට රු.381,166 ක හිඟ ජල ගාස්තු ශේෂයක් විය. සභාව ජල ගාස්තු අයකිරීමේදී පාවිච්චි කළ ඒකක ප්‍රමාණය ගැන නොසළකා නිවසකින් මසකට රු.30 ක්ද ව්‍යාපාරික ස්ථානයකින් රු.75 ක්ද වශයෙන් බිල්කර තිබූ අතර හිඟ උප ලේඛනයට අනුව රු.240 සිට රු.12,037 ක් දක්වා හිඟ ශේෂ පැවතුණි. තවද අවුරුදු 12කට වැඩි කාලයක් ජල ගාස්තු නොගෙවූ ස්ථානද පැවතුණි. | අදාල ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතු අතර පාවිච්චි කළ ජල ඒකක මත ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | වසර 40 කට වඩා පැරණි ජල ව්‍යාපෘතියකි. මෙම හිඟ මුදල් අයකර ගැනීමට උපදෙස් දී ඇත. |

**2.2.8** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.41,693,654 ක් හා උසාවි දඩ රු.7,497,275 ක් විය. | අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | අදාළ උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1** **කාර්ය සාධනය**

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **අතුරු ව්‍යවස්ථා**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා 42 ට අමතරව සභාව විසින් නව අතුරු ව්‍යවස්ථා 12 ක් වැළඳගෙන තිබුණු අතර යෝජිත අතුරු ව්‍යවස්ථාවක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි. | අදාල අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කල යුතු වේ. | එකඟවෙමි. |

**(ආ)** **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

;

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 ජනවාරි 17 හා අංක පීසී/ආර්සී/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04(අ) සිට (ඊ) දක්වා ඡේද ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව ප්‍රාදේශීය සභා පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර 2018 වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ වාර්ෂික සංවර්ධන සැලැස්මේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය දක්වා නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | අංක පීසී/ආර්සී/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූල වන පරිදි සකස් කිරීමට ඉදිරියේදී බලාපොරොත්තු වෙමි. |

**(ඇ)** **ප්‍රතිපාදන නොසැළසීම**

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය තුල ඉටුකිරීමට නියමිත රු.5,940,000 ක් වටිනා කර්මාන්ත 61 න් සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,700,000 ක් වූ කර්මාන්ත 39 ක් පමණක් වැඩ අවසන් කර තිබුණු අතර ණයහිමි වෙන්කිරීම් කරන ලද කර්මාන්තවලින් 14 ක් ඉටුකර නොතිබුණි. | අදාල කර්මාන්ත කඩිනමින් ඉටු කිරීමට කටයුතු කල යුතු වේ. | 2018 අප්‍රේල් මස මහා සභාව පත්වීමෙන් පසු ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා ප්‍රමුඛත්වය දී ඉටු කිරිමට කටයුතු කළ හෙයින් 2018 අය වැය යෝජනාවලට යම් ප්‍රමාණයක් පමණ ඉටු කිරිමට සිදු විය. එසේම ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා 61 න් යෝජනා 06 ක් පමණක් ඉටු කිරිමට නොහැකි වු අතර, කර්මාන්ත 55 ක වැඩ අවසන් වී ඇත. |

**(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය** -------

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ග කිලෝ මීටර් 223 කින් සමන්විත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනනය වන කසළවලින් කොම්පෝස්ට් අංගනයට යොදා ගනු ලබන්නේ කල්පිටිය නගරයේ දිනකට එකතුවන කසළ ට්‍රැක්ටර් ලෝඩ් 04 න් ලෝඩ් 01 ක් පමණි. අනෙකුත් ප්‍රදේශවල එකතුවන කසළ ඒ ඒ ප්‍රදේශවල විවෘත ස්ථානවලට බැහැර කරනු ලබයි. කොම්පෝස්ට් අංගනයේ ගොඩනැගිලි ඉදිකිරීමට 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ රු.6,307,057 ක් හා පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.784,300 ක බේල් මැෂිමක් ආධාර වශයෙන් ලැබී තිබුණු අතර සභා අරමුදලින් මැෂින් සඳහා රු.284,000 ක් වැයකර තිබුණි. කොම්පෝස්ට් අංගනයට තෙකලා විදුලිය ලබාගෙන නොමැති බැවින් මැෂින් නිශ්ක්‍රීයව තිබුණි. 2018 වර්ෂය | අදාල යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විදුලිය කඩිනමින් ලබාගත යුතු වේ. අදාල අඩුපාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතු වේ. | සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කටර් යන්ත්‍රයක් ඇති අතර, එම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට තෙකලා විදුලිය අවශ්‍ය බැවින් මේ දක්වා ක්‍රියාත්මක තත්ත්වයේ නොමැත. ඒ සඳහා තෙකලා විදුලිය ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇත.<br>සමාලෝචිත වර්ෂයේ බේල් යන්ත්‍රය ලැබී ඇති අතර එම යන්ත්‍රය ලැබුණ දින සිට ක්‍රියාත්මකව පැවති බව දන්වා සිටිමි.<br>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් එකී ඉඩම් සභාවට ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇති අතර අක්කර 05ක ඉඩම් කොටසක් ලබා දීමට අදාලව ලිපියක් මේ වන විටත් සභාවට ලබා දී ඇත. සභාවේ සනීපාරක්ෂක |

| | | |
|---|---|---|
| තුල කොම්පෝස්ට් පොහොර අලවියෙන් රු.48,894 ක් හා වෙනත් ආදායම් වශයෙන් රු.34,465 ක් ලැබී තිබුණි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පැවති ඉඩම 2018 මැයි 10 වන තෙක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඝන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද කසළ කළමනාකරණය සම්බන්ධ නීති කඩ කරන්නන්ට එරෙහිව කටයුතු කළ හැකි ක්‍රමයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සෞඛ්‍ය කම්කරුවන් අභිප්‍රේරණය සහ රක්ෂණාවරණය සඳහා සභා ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම කාර්යයන් ඉටුකර නොතිබුණි. | | කම්කරුවන් හා ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කම්කරුවන් වාර්ෂිකව වෛද්‍ය සායන සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, පසුගිය වසරේදිද කම්කරුවන් කල්පිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේදි වෛද්‍ය සායනයට ඉදිරිපත් කරන ලදි. එසේම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සියළුම කම්කරුවන් හා නිලධාරින්ද ඇතුළුව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ හා මහව ප්‍රාදේශීය සභාවේදි පැවැති ඝන අපද්‍රව්‍ය පුහුණු වැඩ සටහන් සඳහා ඉදිරිපත් කරන ලදි. |

**(ඉ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයට අදාල සැළසුම් සකස් කරන අවස්ථාව වන විට තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සැලසුම්වලට ඇතුළත් කළ යුතු බවට සභාව දැනුවත් වී නොතිබුණු බැවින් 2018 වර්ෂයේ සැලසුම්වලට තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ඇතුළත් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීමට සැලසුම් සකස් කළ යුතු වේ. | 2019 අයවැය සහ සැලැසුම් සකස් කිරීමේ දී තිරසර සංවර්ධන අරමුණු ඉටුවන පරිදි ක්‍රියාකාරකම් ඇතුළත් කර ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා** -----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවේ ජල ව්‍යාපෘතියේ වාර්ෂික බිල්කිරීම් රු.36,670 ක් වුවද ජල පොම්පාගාරයේ විදුලි බිල වර්ෂයකට රු.100,000 ඉක්මවා ගෙවීම් කර තිබූ අතර වර්ෂයේ අය කිරීම රු.16,960 ක් වූ බැවින් ජල බිල්පත් ආදායම විදුලි බිල ගෙවීමටවත් ප්‍රමාණවත් නොවිය. | අදාල වියදම් අවම කරගෙන සභා ආදායම් රැස් කිරීමට කටයුතු කල යුතු වේ. | ජලය බෙදා හැරීමේ ජල නල පද්ධතිය නවීකරණය කිරිම සඳහා මහ සභාවේ තීරණයක් ගෙන ඉදිරි වර්ෂයේ අය වැය මඟින් මුදල් වෙන් කිරීමටත්, ඉන් අනතුරුව ජල සැපයුම් සඳහා ජල මීටර් සවිකර නියමිත පරිදි මුදල් අය කර ගැනීමටත් |

| | | | |
|---|---|---|---|
| | | | කටයුතු කරමින් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබූ අතර ඉකුත් වර්ෂයේ අස්ථානගත පොත් 180 ක් හා සමාලෝචිත වර්ෂයේ අස්ථානගත වූ පොත් 1,158 ක් සම්බන්ධයෙන් කිසිම ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | අස්ථාන ගතවීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයට අදාළ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන් අනුව 2017 හා 2018 වර්ෂවල අස්ථාන ගත වී ඇති සියළුම පොත් සම්බන්ධයෙන් කරුණු විමසීමටත් ඊට අදාළව අදාළ පොත් වල වටිනාකම හා 25% ක් වන රජයේ ගාස්තුවද එම සේවක සේවිකාවන්ගෙන් අය කර ගැනීමට ප්‍රජා සංවර්ධන නිලධාරි දැනුවත් කර ඇත. |
| (ඇ) | 2010 වර්ෂයේදී දේපළ තක්සේරු කිරීමෙන් පසු ඉදිකිරීම් අවසන් කරන ලද හා අනුකුලතා සහතික ලබාගත් නිවාස හා ව්‍යාපාරික ස්ථාන සඳහා තාවකාලික තක්සේරුවක් සිදුකර වරිපනම් බිල්කර නොතිබුණි. තවද සභාව වරිපනම් බදු අය කරනුයේ කල්පිටිය නගර සීමාව තුල පමණක් වූ අතර අනෙකුත් නගර වන නොරොච්චෝල, කන්දක්කුලිය, මදුරන්කුලිය හා පාලකුඩා ආදී ස්ථානවල හා කල්පිටිය -පාලවිය ප්‍රධාන මාර්ගය දෙපස දේපළ තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ නීති රීති අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඈ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980/46 දරන චක්‍රලේඛයට අනුව 2013 වර්ෂයේදී කඩ කාමර තක්සේරු කර තිබුණද නමුත් කඩ බදුකරුවන් 19ක් සමග ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | බදුකරුවන් සමග ගිවිසුම්වලට එළඹිය යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඉ) | කර්මාන්ත යටතට ගැනෙන ව්‍යාපාර සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන ඇත්ද යන්න පරීක්ෂා කිරීමේ වැඩ පිළිවෙලක් නොතිබුණි. මේ නිසා වෙළඳ බලපත්‍ර ලබාදී ඇති කර්මාන්ත, ව්‍යාපාර මගින් සිදුවන පරිසර දූෂණය වැළැක්වීමේ ක්‍රමවේදයන් පිළිබඳ සභාව සැළකිලිමත් වී නොතිබුණි. තවද සභා බල ප්‍රදේශයේ පවතින | අදාළ නීති රීති අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

කර්මාන්ත හා ව්‍යාපාර පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ලේකම් තනතුර වසර ගණනාවක සිට පුරප්පාඩු වී පැවති අතර ද්විතියික ශ්‍රේණියේ තනතුරු 05ක් පුරප්පාඩුව පැවතුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතු වේ. | සභාවේ ලේකම් තනතුර වසර කිහිපයක සිට පුරප්පාඩු වී ඇති අතර, මෙතෙක් ඒ වෙනුවෙන් සුදුසු මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරිවරයෙකු පත් කර නොමැත. එසේම ද්විතියික ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 06 ක් පුරවා ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉල්ලීමක් කර ඇත. |

**(ආ) අයවීමට ඇති සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.5,802,471 ක් වූ අතර, එයින් විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා මිය ගිය සේවකයින් 48 දෙනෙකුගෙන් අයවිය යුතු රු.124,843 ක් වර්ෂ 04 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | හිඟ ණය ශේෂය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | කිහිප දෙනෙකු සේවක ණය මුදල් කොටස් වශයෙන් ගෙවීමට කටයුතු කරන බවට දැනුම් දී ඇතත් අනෙක් අයවළුන් දැනට මෙම ප්‍රදේශයෙන් වෙනත් ප්‍රදේශවලට ගොස් ඇති බැවින්, එම අය වෙත මෙතෙක් දැනුම් දීමට නොහැකි වී ඇත. එසේම මිය ගිය අය හට ලබා දී ඇති ණය මුදල් අය කර ගැනීම සඳහා ඔවුන් විසින් ලබා ගන්නා ලද ණය මුදලට කිසිදු වාර්තාවක් නොමැති වීම මත අය කර ගැනීම ගැටළුවක් වී ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට දායකය ලෙස රු.1,984,541ක මුදලක් ගෙවිය යුතුව තිබුණද සභාව එම මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවීම කඩිනමින් කල යුතු වේ. | පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට 1993 වර්ෂයට පෙර විශ්‍රාම ලැබූ සේවකයින් සඳහා සභාව විසින් ගෙවිය යුතු වාරික මුදල් සම්බන්ධව මහ සභාව වෙත යොමු කිරීම සඳහා ඊට අදාළ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් |

| | | | |
|---|---|---|---|
| | | | කිරිමට තොරතුරු සහා ලේඛනාගාරයේ නොමැත. |
| (ආ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් කල්පිටිය ප්‍රාදේශීය සභාව වෙත ලබාදී තිබූ කොඩි කණු 464න් රු.147,344ක් වටිනා කොඩි කණු 115ක් ඉකුත් වර්ෂවලදී බාහිර පාර්ශව වෙත ලබාදී තිබුණු අතර, එම කොඩි කණු හෝ එහි වටිනාකම මුදලින් හෝ ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2017 වර්ෂයේදී කොඩි කණු 31ක්ද 2018 වර්ෂයේදී කොඩි කණු 62ක්ද අස්ථානගත වී තිබුණි. ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | අදාල වත්කම් ආරක්ෂා කිරීම හා අස්ථානගතවීම් සම්බන්ධයෙන් කටයුතු කල යුතු වේ. | කොඩි කණු භාර දෙන ලෙසට සියළුදෙනාටම ලිඛිතව දැනුම් දී තිබුණද මෙතෙක් එම කොඩි කණු නැවත භාරදීමට කටයුතු කර නොමැත. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන කාර්යාලය මගින් අනෙකුත් උප කාර්යාල, පෙර පාසල්, පුස්තකාල සහ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන වෙත ලබාදී ඇති භාණ්ඩ එම කාර්යාලවලින් වෙනත් ස්ථාන කරා රැගෙන ගොස් ඇති අතර ඒ පිළිබඳව තොග/ඉන්වෙන්ට්‍රි ලේඛනවල සටහන් තබා නොතිබුණි. | අදාල ලේඛන ඉන්වෙන්ට්‍රි යාවත්කාලීනව නඩත්තු කල යුතු වේ. | සභාවේ උපකාර්යාල, පෙර පාසල්, පුස්තකාල සහ අනෙකුත් සභා සතු ස්ථාන සඳහා පසුගිය වර්ෂයේ තොග ලේඛනයේ සටහන් නොතබා රැගෙන ගොස් ඇති භාණ්ඩ සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ගබඩා නිලධාරිවරයාට තොග ලේඛනය සකස් කරන ලෙස දැනුම් දී ඇත. |
| (ආ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව විනාශ කළ හා විකුණු භාණ්ඩ තොග ලේඛනවලින් හා ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ වාර්තා අනුව අදාල කටයුතු කඩිනමින් සිදු කළ යුතු වේ. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව වෙන්දේසි සඳහා යොමු කරන ලද භාණ්ඩ තක්සේරු මුදලට ලබාගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවූ බැවින් භාණ්ඩ වෙන්දේසි නොවීය. |

### 3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ගබඩා භාරකරු භාරයේ පැවති ප්‍රොජෙක්ටර් යන්ත්‍රය අස්ථානගත වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | අදාල පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | සභාව සතු ප්‍රොජෙක්ටර් යන්ත්‍රය ප්‍රජා සංවර්ධන අංශය මගින් වැඩසටහනකට රැගෙන ගොස් එහිදී අස්ථානගත වීමක් සිදුවී ඇති අතර ඒ සම්බන්ධයෙන් අදාල අංශ භාර නිලධාරිගෙන් කරුණු විමසීමට කටයුතු කර ඇත. එම නිලධාරිගේ අතපසුවිමෙන් එම සිදුවී ඇති බැවින් අදාල යන්ත්‍රයේ වටිනාකම හා එයට අදාල 25% ක රජයේ ගාස්තුවක් ගෙවීමට කටයුතු කරන ලෙසට ප්‍රජා සංවර්ධන අංශයේ අංශ ප්‍රධානී වෙත දැනුම් දීමක් කර ඇත. |

### 3.5.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළිසරු ව්‍යාපෘතිය මගින් ඉකුත් වර්ෂයේදී ලබාදී තිබූ රු.225,000 ක් වටිනා කසළ කැබලි කරන යන්ත්‍රයක් හා සමාලෝචිත වර්ෂයේදී ලැබූ රු.784,300 ක් වටිනා කසළ කැබලි කරන යන්ත්‍රවලට තෙකලා විදුලිය සපයා නොමැති බැවින් ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි. | කඩිනමින් විදුලිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිසරු ව්‍යාපෘතිය මගින් ලැබී ඇති කැබලි යන්ත්‍රය ක්‍රියාත්මක කිරිම සඳහා තෙකලා විදුලිය අවශ්‍ය බැවින් තෙකලා විදුලිය ලබාගැනිම සඳහා ඉල්ලුම් කර ඇත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | වැඩි අවධානය යොමුකර විගණ සැලසුමක් අනූ කටයුතු කල යුතු වේ. | අභ්‍යන්තර විගණන නිලධාරි ලෙස රාජකාරි පැවරී ඇති නිලධාරි හට අභ්‍යන්තර විගණන විෂයයට අමතරව තවත් විෂයයන් කිහිපයක් පැවරී ඇති හෙයින් කාලය කළමනාකරණය කරගැනීමේ අපහසුතාව මත ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැති බවට කරුණු පැහැදිලි කරමි. මෙම අඩුපාඩුව නිවැරදි කර ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇත. |